# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.19 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1911/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. සැකකටයුතු මරණයක් - පොල්පිතිගම පොලිස් වසම.**

2025.10.18 වන දින සවස් කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ කුඹුකුලැව ප්‍රදේශයේ කුඹුරු ඉඩමක පුද්ගලයෙකු මියගොස් ඇති බවට පොල්පිතිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ මහවැව පාර, කුඹුකුලැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කුඹුරේ නියර බැඳීමට ගොස් ඇති අතර නිවසට නොපැමිණීම හේතුවෙන් සොයා බැලීමේදී කුඹුරේ මුණින් අතට වැටී මියගොස් සිට ඇති අතර හදිසි මරණ පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - වාලච්චේන පොලිස් වසම.**

2025.10.18 වන දින දහවල් කාලයේ වාලච්චේන පොලිස් වසමේ කාවත්තමුන ප්‍රදේශයේ අතුරු මාර්ගයක ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගය අයිනේ නතරකර තිබූ අත් ට්‍රැක්ටරයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලබූ ත්‍රීරෝද රථයේ පිටුපස අසුනේ ගමන්ගත් මිරිමි දරුවෙකු වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මියගිය මිරිමි දරුවා වයස අවුරුදු 09 ක් වූ කාවත්තමුන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. සිද්ධියට සම්බන්ධ ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.

2025.10.18 වන දින රාත්‍රී කාලයේ මිහින්තලය පොලිස් වසමේ සීප්පුකුලම ගලෙන්බිඳුනුවැව මාර්ගයේ පාළුවැව ප්‍රදේශයේදී ගලෙන්බිඳුනුවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය අයිනේ නවතා තිබූ කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු තම්මැන්නාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ සීප්පුකුලම, මිහින්තලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තම්මැන්නාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ කැබ් රථයේ රියදුරු පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**